සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**தென் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education, Southern Province**

32 | S | I

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - දෙවන වාර පරීක්ෂණය - 2019 මාර්තු**
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை - இரண்டாம் தவணைப் பரீட்சை - 2019 மார்ச்
**General Certificate of Education (Adv. Level) - Second Term Test - 2019 March**

| 12 ශ්‍රේණිය Grade 12 | ව්‍යාපාර අධ්‍යයනය - I Business Studies - I | පැය එකයි One hours |
|---|---|---|

**උපදෙස්**
- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **ප්‍රශ්න අංක 01 සිට 10 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.**
- **ප්‍රශ්න අංක 11 සිට 20 තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාල තිත් ඉර මත ලියන්න.**
- **සෑම ප්‍රශ්නයකටම ලකුණු 02 බැගින් හිමිවේ.**

(01) ''පෞද්ගලික අංශයේ ප්‍රවාහන හා සැපයුම් සේවා සපයන ආයතනයක විධායක නිලධාරියෙකු ලෙස ස්ථිර සේවයේ නිරත නෙතුජ රත්නායක මහතා රැකියාවේ උසස් වීමක් බලාපොරොත්තුවෙන් වෘත්තීය කළමණාකරණ පුහුණු පාඨමාලාවක් හදාරමින් සිටියි. සේවා ස්ථානයට ආසන්නව, රත්මලාන ප්‍රදේශයෙන් දෙමහල් නිවසක් මිලදී ගත් ඔහු එහි සිට සේවා ස්ථානය දක්වා වූ කෙටි දුර පයින් යාම සිදු කළේ ඉතා සතුටිනි. එසේම ඔොහු සේවා ස්ථානයේ බොහෝ රාජකාරී නිවසේ සිට ආයතනයේ වෙබ් පිටුවට ප්‍රවේශ වී ඉටුකිරීමටද පුරුදුව සිටියි.''
ඉහත සිද්ධියට අනුව **නෙතුජ රත්නායක මහතා** විසින් සපුරාගනු ලබන මිනිස් අවශ්‍යතා ගණන වන්නේ,

1. 2කි 2. 3කි. 3. 4කි. 4. 5කි. 5. 6කි. (..........)

(02) ව්‍යාපාවල පැවැත්ම හා සාර්ථකත්වය කෙරෙහි බලපාන ප්‍රධාන සාධකය වන්නේ,
1. ගණුදෙණුකරුවන්ගේ අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කරන භාණ්ඩ හා සේවා නිපදවීම
2. ව්‍යාපාරයේ හිමිකරුවන් වෙත ඉහළ ලාභ ලබාදීම
3. සමාජයේ යහපත වෙනුවෙන් විවිධ සමාජ සේවා ඉටු කිරීම
4. තාක්ෂණික දැනුම, කුසලතා හා ආකල්පවලින් පිරිපුන් සේවකයන් කණ්ඩායමක් සේවයේ නිරත කිරීම
5. තත්ත්වයෙන් උසස් ගුණාත්මක භාණ්ඩ අවම මිලකට සැපයීම (..........)

(03) සාර්ව පරිසර බලවේග, ව්‍යාපාරයේ පැවැත්මට බලපෑම් කරන ආකාරය නිවැරදිව දක්වා ඇති ප්‍රකාශය කුමක්ද?
1. ආර්ථික පරිසර සාධකයක් වන බැංකු පොළී අනුපාතිකය සීඝ්‍රයෙන් ඉහළයාම නිසා ව්‍යාපාරවලට ව්‍යාපාරික අවස්ථා උදාවී ව්‍යාපාරවල පැවැත්ම තහවුරු වේ.
2. ප්‍රජා පරිසර සාධකයක් වන ජනගහනය වර්ධනය සිදුවන විට, නිෂ්පාදන ව්‍යාපාරවලට නිෂ්පාදන ධාරිතාවය පහළ දැමීමට සිදුවීම තුලින් ව්‍යාපාරවල පැවැත්මට තර්ජනයක් ඇති වේ.
3. තාක්ෂණික පරිසර සාධකයක් වන සන්නිවේදන තාක්ෂණය වෙනස්වීම, ලොවපුරා නව ව්‍යාපාර ආරම්භ වීමටත් ඇතැම් ව්‍යාපාර වැසීයාමටත් හේතුවක් වී ඇත.
4. සමාජ හා සංස්කෘතික පරිසර සාධකයක් වන මිනිසුන්ගේ විශ්වාස, සාරධර්ම ආදිය පිරිහීම තුළ

මිනිසුන්ට අන්‍යයන් කෙරෙහි ඇති ධනාත්මක ආකල්ප ඇති නොවීම නිසා ව්‍යාපාරවලට, ව්‍යාපාරික අවස්ථා උදා වී තිබේ.

5. ගෝලීය පරිසරය තුළ ව්‍යාපාර අතර තරඟකාරීත්වය වැඩිවීම, හේතුවෙන් රටවල් ජාත්‍යන්තර වෙළෙඳ ගිවිසුම් ඇතිකර ගැනීමට පෙළඹීම නිසා නිදහස් වෙළෙඳාමට බාධා උදාවීම වැඩිවී ව්‍යාපාරවල පැවත්ම වර්ධනය වී ව්‍යාපාරවල වෙළෙඳපොළ කොට පුළුල් වේ. (..........)

(04) පහත දැක්වෙන්නේ ව්‍යාපාරයක් ආර්ථික තිරසර බව වෙනුවෙන් සහ සමාජ හා සංස්කෘතික තිරසර බව වෙනුවෙන් කටයුතු කරන විට අවධානය යොමු කළ යුතු කරුණු කීපයකි.

A - සේවා නියුක්තිය
B - ජනතාවට සමාන අවස්ථා ලබාදීම
C- තරඟකාරීත්වය
D - අන්තර්ජාතික වෙළෙඳාම
E - ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම
F - කාර්යක්ෂමතාවය
G - සේවක සබඳතා
H - සංස්කෘතික පරිසරය සුරකීම

ඉහත දෑ අතරින් ආර්ථික තිරසර බව වෙනුවෙන් ව්‍යාපර කටයුතු කරන විට අවධානය යොමු කළ යුතු කරුණු පමණක් ඇතුළත් පිළිතුර කුමක් ද?

1. BEGH 2. ABDE 3. DEGH 4. CEFH 5. ACDF (..........)

(05) වෙළෙඳ ව්‍යාපාරයක් විසින් දිගුකාලයක් තිස්සේ සිදුකරන ලද වෙළෙඳ විෂමාචාර පිළිබඳව පාරිභෝගික සමිති සංවිධානයක් විසින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට පැමිණිලි කර ඇත. එම විෂමාචාර වනුයේ, කෘමිනාශක හා රසායනික පොහොර යොදා වගා කර, අලෙවිය සඳහා වෙළෙඳපොළට ඉදිරිපත් කර තිබූ දොඩම් ගෙඩිවල අලවා තිබූ ස්ටිකරයේ අංකය ව්‍යාජ ලෙස වෙනස් කර තිබීම, පාන් පිටි මිශ්‍ර කළ තුනපහ පැකට් විකිණීමට ඉදිරිපත් කර තිබීම, SLS සහතික ලාංඡනය නොමැතිවීම පානීය ජල බෝතල් විකිණීමට තිබීම, භාණ්ඩ මිලදී ගැනීමෙන් පසු ඉතිරි මුදල් ආපසු නොදී ඒ වෙනුවට ගිනිපෙට්ටි, ටොෆි වැනි වෙනත් භාණ්ඩයක් ලබාදීම. ඉහත සිද්ධියට අනුව කඩ වී ඇති පාරිභෝගික අයිතිවාසිකම් ගණන වන්නේ,

1. 3කි 2. 4කි 3. 5කි 4. 6කි 5. 7කි. (..........)

(06) පහත දැක්වෙන්නේ ව්‍යාපාර සංවිධානයකට අයත් ලක්ෂණ කිහිපයකි.

A - අවම අධ්‍යක්ෂකවරු සංඛ්‍යාව දෙකකි.
B - අවම සාමාජික සංඛ්‍යාව එකකි.
C - කොටස් වෙළෙඳපොලේ නාම ලේඛනයට නම ඇතුළත් කළ හැක.
D - ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණයකින් තොරව ලාභාංශ බෙදාහැරිය නොහැක.
E - වගකීම මිලදී ගත් කොටස්වල අගයට සීමා වේ.

ඉහත ලක්ෂණවලින් යුත් ව්‍යාපාර සංවිධාන වර්ගය වන්නේ කුමක් ද?

1. සීමාසහිත පෞද්ගලික සමාගම්
2. සීමාසහිත අක්වෙරළ සමාගම්
3. සීමාසහිත පොදු සමාගම්
4. රාජ්‍ය සමාගම්
5. ඇපයෙන් සීමිත සමාගම් (..........)

(07) පහත දැක්වෙන්නේ වරලත් ව්‍යාපාර ක්‍රමය මගින් ලැබෙන ප්‍රතිලාභ කිහිපයකි.

1. තමාගේ ආයෝජනයකින් තොරව ව්‍යාපාරය පුළුල් කරගත හැකිය.
2. අමුද්‍රව්‍ය අවම මිලකට ලබාගත හැකිවීම
3. අසාර්ථකවීමේ ප්‍රවනතාව අඩුවීම
4. ප්‍රචාරණ වියදම් බෙදාගත හැකිවීම
5. මූල්‍ය පහසුකම් ලැබීම

ඉහත දෑ අතුරින් වරලත්ලාභියාට පමණක් ලැබෙන ප්‍රතිලාභ ඇතුළත් පිළිතුර කුමක් ද?

1. 2, 3, 5 2. 1, 4, 5 3. 3, 4, 5 4. 1, 4, 6 5. 2, 3, 4 (..........)

(08) පහත දැක්වෙන්නේ ව්‍යවසායකත්ව ක්‍රියාවලිය පියවර කීපයකි.

A - ප්‍රතිලාභ ලැබීම

B - අවශ්‍ය සම්පත් සම්පාදනය

C - නව්‍යතා සොයා ගැනීම

D - යථාර්ථයක් බවට පත් කිරීම

E - සංකල්ප ගොඩනැගීම හා ව්‍යාපාර සැලැස්ම සැකසීම

ඉහත දැක්වෙන ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ පියවර අනුපිළිවෙලින් දක්වා ඇති පිළිතුරු කාණ්ඩය තෝරන්න.

1. E C B D A  2. A B D C E  3. C D E B A  4. C E B D A  5. B D C A E

(..........)

(09) පහත දැක්වෙන්නේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හඳුනාගැනීම සඳහා ජාතික මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ඉදිරිපත් වී ඇති නිර්ණායක කීපයකට අදාල නිදසුන් ය.

A - වෙළෙඳපොළ ස්වභාවය  B - ව්‍යාපාර සංවිධාන ක්‍රමය

C - වාර්ෂික පිරිවැටුම  D - භාවිතයට ගන්නා බලශක්තිය

E - භාවිතාකරණ තාක්ෂණය  F - ආයෝජිත ප්‍රාග්ධන ප්‍රමාණය

ඉහත දෑ අතුරින් ගුණාත්මක සාධක ලෙස පිළිගත හැක්කේ කුමක් ද?

1. C D F  2. A C F  3. A B D  4. B C F  5. A B E (..........)

10) පහත වගුවේ X තීරුවේ ශ්‍රී ලංකා මහ බැංකුව මූල්‍ය ආයතන වර්ග කර ඇති ප්‍රධාන ආකාර ද Y තීරුවේ ඒවාට අදාල වන ආයතනද දක්වා තිබේ.

| X | Y |
|---|---|
| A - විශේෂිත මූල්‍ය ආයතන<br>B - බැංකු ආයතන<br>C - ගිවිසුම්ගත ඉතිරි කිරීමේ ආයතන | 1. රක්ෂණ සමාගම්<br>2. ශ්‍රී ලංකා මහ බැංකුව<br>3. රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල<br>4. ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම්<br>5. බලපත්‍රලාභී විශේෂිත බැංකු<br>6. විශේෂිත කල්බදු සමාගම් |

X හා Y තීරු නිවැරදිව ගලපා ඇති පිළිතුර තෝරන්න.

1. A - 1, 6 / B - 2, 5 / C - 3, 4  2. A - 4, 6 / B - 2, 5 / C - 1, 3

3. A - 2, 4 / B - 1, 3 / C - 5, 6  4. A - 4, 5 / B - 3, 6 / C - 1, 2

5. A - 3, 6 / B - 4, 5 / C - 3, 6

(..........)

- **ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

(11) (අ) 1. ............................................ හා 2. .......................................... එකතුව වාණිජ ලෙස හඳුන්වන අතර ව්‍යාපාර ආරම්භ කර පවත්වාගෙන යාමට අවශ්‍ය 3. ..................................................... 4. .......................................... ආදිය ව්‍යාපාර සහාය සේවාවලට නිදසුන් වේ.

(ආ) සේවක ලිපි ගොනු පවත්වාගෙන යාම, සේවකයින් බඳවා ගැනීම, තොග පාලනය හා නිෂ්පාදන වැඩි දියුණු කිරීම අනු පිළිවෙල අනුව 1. .............................................................. 2. ......................................................... 3. ............................................................................. 4. ...................................................................... යන ව්‍යාපාර කාර්යයන්ට අයත් වේ.

(12) (අ) කිසියම් රටක් සමාජ තිරසර සංවර්ධනය හා පාරිසරික තිරසර ආරක්ෂණය පමණක් ලඟාකර ගෙන ඇත්නම් එම රට ........................................................................................................................ රටක් බවට පත් වී ඇති බව දක්වේ. එසේම කිසියම් රටක් සමාජ තිරසර සංවර්ධනය හා ආර්ථික තිරසර සංවර්ධනය පමණක් ලඟාකර ගෙන ඇත්නම් එම රට ........................................................................................................ පත්ව ඇති බව දක්වේ.

(ආ) රටක සමස්ථ නිෂ්පාදනය එරටේ වෙසෙන සමස්ථ ජනතාව අතර සමානව බෙදා හැරීම ....................................................................................... ලෙස හඳුන්වන අතර ආර්ථිකයක් දේශීය හා විදේශීය වශයෙන් අර්බුදයක් ඇති නොවීමට ඔරොත්තු දීමේ හැකියාව ...................................................................... ලෙස හැඳින්වේ.

(13) (අ) වෙන් වෙන්ව පැවති සමාගම් දෙකක් හෝ කිහිපයක් තනි ව්‍යාපාරයක් බවට පරිවර්තනය වීම ....................................................................................... ලෙස හැඳින්වෙන අතර එක් සමාගමක් විසින් අනෙක් සමාගමේ සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන් වැඩි ප්‍රමාණයක් මිලට ගැනීම .................................... ...................................................................................... දී සිදුවේ.

(ආ) ව්‍යවසායකත්වය තුළින් නව රැකියවා සම්පාදනය කිරීම නිසා ආර්ථික සංවර්ධනය වේගවත් වන ආකාරය දක්වෙන පහත ගැලීම් සටහනෙහි හිස්තැන් පුරවන්න.

නව රැකියා අවස්ථා → 1. .................................................................. → 2. ...............................................

↑ 4. .................................................... ← 3 ........................................................................... ↵

(14) පහත සඳහන් වගන්තිවල සත්‍ය හෝ අසත්‍ය බව සඳහන් කරන්න.

සත්‍ය / අසත්‍ය

1. වක්‍ර බදු පැනවීම නිසා භාණ්ඩ හා සේවාවල මිල ඉහළයන අතර ඍජු බදු පැනවීම නිසා ව්‍යාපාරිකයන් කළ කිරීමට පත්වේ. (..........................)

2. රටක රාජ්‍ය ආදායම හා රාජ්‍ය වියදම පිළිබඳ වූ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රතිපත්තිය වේ. (..........................)

3. සිය ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳවත් එමගින් සමාජයට වන බලපෑම පිළිබඳවත් පෞද්ගලිකවම ව්‍යාපාර වගකීම සමාජ වගකීම බව පිලිපිනය ප්‍රකාශයට පත්කර ඇත. (..........................)

4. ශ්‍රී ලංකාවේ විශිෂ්ඨතම ව්‍යවසායකයා තේරීම ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය මගින් සිදු කරයි. (..........................)

(15) (අ) ශ්‍රී ලංකාවේ චෙක්පත් හා අණකර හුවමාරුව සිදුකරන ආයතනය ...................................................................
................. වන අතර චෙක්පත් නිශ්කාශනය සඳහා ගතවන උපරිම දින ගණන ......................................වේ.

(ආ) වාණිජ බැංකු සපයන තැන්පතු ආශ්‍රිත සේවා ලෙස 1. ........................................................................... හා 2. .......................................................................... දක්විය හැකි අතර වාණිජ බැංකු සපයන ණය ආශ්‍රිත සේවා ලෙස 1. ........................................................ 2. ........................................................... දක්විය හැක.

- **ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු සපයන්න.**

(16) පහත සඳහන් අභ්‍යන්තර හා ආසන්න පරිසර බලවේග ව්‍යාපාර කෙරෙහි ඇතිකරන හිතකර හා අහිතකර බලපෑම් එක බැගින් ලියන්න.

| පරිසර බලවේග | හිතකර බලපෑම් | අහිතකර බලපෑම් |
| --- | --- | --- |
| 1. කළමණාකරුවන් | ................................................................ | ................................................................ |
| 2. සම්පත් | ................................................................ | ................................................................ |
| 3. සැපයුම්කරුවන් | ................................................................ | ................................................................ |
| 4. තරඟකරුවන් | ................................................................ | ................................................................ |

(17) ව්‍යාපාර ආයතනයක් විසින් සාමජය වෙත ඉටු කළ යුතු සමාජ වගකීම් 4 ක් ලියන්න.

1. ........................................................................................................................................................
2. ........................................................................................................................................................
3. ........................................................................................................................................................
4. ........................................................................................................................................................

(18) පාරිභෝගික ආරක්ෂණය වෙනුවෙන් ක්‍රියාත්මක පහත ප්‍රමිතීන්ට අදාල පද්ධති සහතිකකරණයන් ලියන්න.

1. ISO - 14001 : ........................................................................................................................
2. ISO - 26000 : ........................................................................................................................
3. ISO - 45000 : ........................................................................................................................
4. ISO - 50001 : ........................................................................................................................


(19) පහත සඳහන් රටවල් හා ජාත්‍යන්තර සංවිධාන භාවිතා කරන මුදල් වර්ග නම් කරන්න.

1. මහා බ්‍රිතාන්‍ය - ..................................................
2. යුරෝපා සංගමය - ..................................................
3. චීනය - ..................................................
4. උතුරු කොරියාව - ..................................................

(20) පහත සඳහන් සංකේතවලින් අදහස් කරන්නේ කුමක් ද?

1. 

- ..................................................................................................

2. 

- ..................................................................................................

3. 

- ..................................................................................................

4. 

- ..................................................................................................

The National e-Learning Portal for The General Education

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**தென் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education, Southern Province**

32 | S | II

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - දෙවන වාර පරීක්ෂණය - 2019 මාර්තු**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை - இரண்டாம் தவணைப் பரீட்சை - 2019 மார்ச்**
**General Certificate of Education (Adv. Level) - Second Term Test - March 2019**

**12 ශ්‍රේණිය**
**Grade 12**

**ව්‍යාපාර අධ්‍යයනය - II**
**Business Studies - II**

**පැය දෙකයි**
**Two hours**

**උපදෙස්**
- **ඔබ කැමති ඕනෑම ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

(01) I. (අ) අතීතයේ පැවැතියේ මූලික අවශ්‍යතාවයන් කීපයක් පමණක් වුවත් වර්තමානයේදී අවශ්‍යතා ප්‍රමාණයද වර්ධනය වී ඇත. ඊට බලපා ඇති හේතු මොනවාද? (ලකුණු 02)

(ආ) පියසිරි තමාගේ ඉඩමේ එළවළු වගා කර නිවසේ පරිභෝජනයට ගෙන ඉතිරිය අසල්වාසින්ට අලෙවි කරයි. ඔහුට ඇති වූ හදිසි මුදල් අවශ්‍යතාවයක් හේතුවෙන් ඉඩමේ කොටසක් කුසුම්සිරිට විකුණන ලදී. කුසුම්සිරි ද එම ඉඩමේ එළවළු වගා කොට අලෙවි කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කල ද එය පියසිරිට මෙන් සාර්ථකව කල හැකිවේදැයි සැකයෙන් පසුවේ.
ඉහත සිද්ධියට අනුව හඳුනාගත හැකි ව්‍යාපාර ගති ලක්ෂණ 02 ක් දක්වන්න. (ලකුණු 02)

II. (අ) ව්‍යාපාර විකාශනයේ අවස්ථා කීපයක් දැකිය හැකි වුවත් ඉන් වැදගත්ම අවස්ථා හතර පිළිවෙලින් ලියන්න. (ලකුණු 02)

(ආ) තොරතුරු තාක්ෂණයේ දියුණුවත් සමග වර්තමාන ව්‍යාපාර ක්ෂේත්‍රයේ සිදු වී ඇති ප්‍රවණතා 4 ක් දක්වන්න. (ලකුණු 02)

III. රාජ්‍ය දැව සංස්ථාව ලී බඩු නිෂ්පාදනය කර තම ප්‍රදර්ශනාගාරවල තබා අලෙවි කරයි. ඒ සම්බන්ධ කරුණු කීපයක් පහතින් දක්වා ඇති අතර එම කරුණු ව්‍යාපාර වර්ගීකරණ පදනම් මත දක්වන්න.
(දැව කැපීම, දෙසැම්බර් මස සේල් පැවැත්වීම, රාජ්‍ය දැව සංස්ථාව, විශාල සේවක සංඛ්‍යාවක් සිටීම, නිෂ්පාදිත ගෘහ භාණ්ඩ) (ලකුණු 04)

IV. ඇඟළුම් කර්මාන්ත ශාලාවක් තුළ සිදු කෙරෙන නිෂ්පාදන ක්‍රියාවලියකට අයත් ව්‍යාපාර කාර්යයන් නම් කර එම කාර්යන්ට අයත් වන උදාහරණය බැගින් සපයන්න. (ලකුණු 04)

V. විවිධ අරමුණු ඉටු කර ගැනිම සඳහා පාර්ශව රාශියක් ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වයි. එසේම එම පාර්ශව විවිධ හේතුන් නිසා ව්‍යාපාරයකටද වැදගත්වේ. එසේ ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශව ව්‍යාපාරයකට වැදගත් වීමට බලපාන හේතු පාර්ශව 4 ක් ඇසුරෙන් දක්වන්න. (ලකුණු 04)

(02) I. (අ) ව්‍යාපාර කෙරෙහි රජයේ බලපෑම ආකාර කීපයකට සිදුවේ. එසේ රජය බලපෑම් කරන ආකාර මොනවාද? (ලකුණු 01)

(ආ) කර්මාන්ත ශාලාවක් උදාහරණ ලෙස ගෙන එම බලපෑම් සිදුවන ආකාරය දක්වන්න. (ලකුණු 03)

II. (අ) රටක සංවර්ධනය සඳහා ව්‍යාපාර විවිධාකාරයේ දායකත්වයන් සිදු කරයි. එසේ ව්‍යාපාර දායකත්වය දක්වන ක්‍රම මොනවාද? (ලකුණු 02)

(ආ) ශ්‍රී ලංකාවේ බලශක්ති අර්බුදය සම්බන්ධයෙන් විවිධ යෝජනා ඉදිරිපත් වෙමින් පවතී. ඒ සඳහා ගත හැකි ක්‍රියා මාර්ග 4 ක් ඉදිරිපත් කරන්න. (ලකුණු 02)

III. (අ) විදේශ ආයෝජන ආකර්ශණය කර ගැනීමට රජයන් විසින් අනුගමනය කරන උපාය මාර්ග රාශියකි. එවැනි උපාය මාර්ග 4 ක් දක්වන්න. (ලකුණු 02)

(ආ) ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයෙන් ආර්ථිකයට ලැබෙන දායකත්වය ක්‍රමයෙන් අඩුවීමට බලපා ඇති හේතු මොනවාද? (ලකුණු 02)

IV. (අ) රජය, ව්‍යාපාර පාලනයට නිවැරදි ලෙස මැදිහත් නොවීම නිසා ඇතිවිය හැකි අහිතකර ප්‍රතිඵල මොනවාද? (ලකුණු 02)

(ආ) ශ්‍රී ලංකාව තුළ ආයෝජනය කර ඇති ප්‍රධාන රටවල් 6ක් නම් කරන්න. (ලකුණු 02)

V. පොලිතීන් භාවිතය තහනම් කිරීම හා එළවළු පළතුරු ප්‍රවාහනයට ප්ලාස්ටික් බහාලුම් එක් කිරීම සම්බන්ධයෙන් බලපාන සාර්ව පරිසර බලවේග 4 ක් නම් කර එම පරිසරයන් මගින් සිදු කරන බලපෑම දක්වන්න. (ලකුණු 04)

(03) I. රටක සංවර්ධනයට වඩාත් වැදගත් වන්නේ ව්‍යාපාරිකයින්ට වඩා ව්‍යවසායකයින්ය. ව්‍යාපාරිකයා හා ව්‍යවසායකයා අතර සැසඳීමක් කරන්න. (ලකුණු 04)

II. ව්‍යවසායකත්ව සංවර්ධනය තුළින් ලබා ගත හැකි ප්‍රතිලාභ රාශියකි. ඉන් පුද්ගලයෙකු ලබන ප්‍රතිලාභ සහ සමාජීය හා ආර්ථික වශයෙන් ලබා ගත හැකි ප්‍රතිලාභ වෙන් කර දක්වන්න. (ලකුණු 04)

III. හරිත ඩෙංගු මර්ධනයට පිළියමක් ලෙස නව මදුරු දැල් විශේෂයක් නිපදවීම සඳහා කලක පටන්ම දැඩි උත්සාහයක යෙදී සිටී. තමාට එය කළ හැකියි යන විශ්වාසය මත පිහිටා විවිධ පර්යේෂණවල නිරත වන අතර විවිධ පුහුණු වැඩසටහන් වලටද, අන්තර්ජාලය මගින් ඒ සඳහා අවශ්‍ය දැනුම ද ලබා ගනී. මීට පෙර ඔහු ප්‍රසිද්ධ මදුරු දැල් නිෂ්පාදන ආයතනයක සේවය කර ලබා ගත් දැනුමද මේ සඳහා යොදා ගන්නා අතර ළඟදීම තම නව නිෂ්පාදනය වෙළඳපොලට ඉදිරිපත් කළ හැකි බව ඔහුගේ විශ්වාසයයි.

මෙම සිද්ධියට අනුව හරිත තුළ ඇති ව්‍යවසායකත්ව ගති ලක්ෂණ හා කුසලතා වර්ධනය කර ගත හැකි ආකාර කීපයක් හඳුනා ගත හැකියි. ඒ මොනවාදැයි උදාහරණ සහිතව පෙන්වන්න. (ලකුණු 04)

The National e-learning Portal for The General Education

IV. වත්මන් තරුණ පිරිස රජයේ හෝ පෞද්ගලික අංශයේ රැකියාවක් කරනවාට වඩා ස්වයං රැකියා කෙරෙහි යොමු වීමේ ප්‍රවණතාවයක් දැකිය හැකියි. මේ සඳහා බලපා ඇති හේතු මොනවාද?

(ලකුණු 04)

V. ව්‍යවසායකයින් දිරිගැන්වීම සඳහා 2018 අයවැයෙන් හඳුන්වා දුන් "එන්ටර්ප්‍රස් ශ්‍රී ලංකා" ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා දෙන ණය යෝජනා ක්‍රම 4 ක් නම් කරන්න. (ලකුණු 04)

(04) I. (අ) ව්‍යාපාර සුළු හා මධ්‍ය පරිමාණ වශයෙන් වෙන් කර හඳුනා ගැනීමේ අවශ්‍යතාවය කුමක්ද?

(ලකුණු 02)

(ආ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයක් ආරම්භ කිරීමේදී සළකා බැලිය යුතු සාධක මොනවාද?

(ලකුණු 02)

II. (අ) විධිමත් ව්‍යාපාර සංවිධානයක දැකිය හැකි පොදු ලක්ෂණ නම් කරන්න. (ලකුණු 02)

(ආ) කේවල ස්වාමි ව්‍යාපාරයක හා හවුල් ව්‍යාපාරයක සමාන ලක්ෂණ දක්වන්න. (ලකුණු 02)

III. (අ) පහත සඳහන් වගන්ති බලපානු ලබන ව්‍යාපාර සංවිධානය නම් කරන්න.

A. ප්‍රාග්ධනයට අතිරේකව ගෙවන ණය මුදල් සඳහා 5% ක පොළියක් හිමිවේ.

B. කොටස් හා ණයකර මිලදී ගැනීමට ප්‍රසිද්ධියේ ආරාධනා කළ නොහැක.

C. උපයන ලාභයෙන් පුරස්කාරයක් ගෙවිය යුතුය.

D. කොටස් වල අගය වෙනස් නොවී පවතී. (ලකුණු 02)

(ආ) ස්වාධීනව ක්‍රියාත්මක වූ ව්‍යාපාර පසු කාලයේදී තවත් ව්‍යාපාර සමඟ ඒකාබද්ධව කටයුතු කිරීම ව්‍යාපාර ලෝකයේ සිදුවන්නකි. එසේ ව්‍යාපාර ඒකාබද්ධ වී කටයුතු කිරීමට හේතු මොනවාද?

(ලකුණු 02)

IV. පහත සඳහන් විස්තරය කියවා එහි අන්තර්ගත රාජ්‍ය සංස්ථාවක් සම්බන්ධයෙන් සත්‍ය කරුණු 4ක් ද, රජයේ දෙපාර්තමේන්තුවක් සම්බන්ධයෙන් අසත්‍ය කරුණු 4 ක් ද තෝරන්න.

රාජ්‍ය සංස්ථා පාර්ලිමේන්තුවේ පොදු හෝ විශේෂ පනතක් මගින් සම්මත කරන අතර දෙපාර්තමේන්තුවක් අමාත්‍යාංශයක සෘජු පාලනයට යටත්වේ. දෙපාර්තමේන්තුවකට අවශ්‍ය ප්‍රාග්ධනය රජය මෙන්ම පෞද්ගලික අංශය සැපයුවත් රාජ්‍ය සංස්ථාවක ප්‍රාග්ධනයෙන් 51% කට වැඩි ප්‍රමාණයක් රජය සතුවේ. රාජ්‍ය සංස්ථා හා දෙපාර්තමේන්තු යන අංශ දෙකටම නෛතික පුද්ගලභාවයක් ඇත. දෙපාර්තමේන්තු පාලනයට ආයතන සංග්‍රහයේ බලපෑමක් නැත. නිෂ්පාදන, වෙළඳ, මූල්‍ය සහ සේවා යන ක්ෂේත්‍ර 4 තුළ මෙම සංවිධාන දෙවර්ගය කටයුතු කරයි. රාජ්‍ය සංස්ථා වල අයිතියෙන් කොටසක් පෞද්ගලික අංශයට ද ලබා දිය හැකිය. (ලකුණු 04)

V. සීමිත පොදු සමාගම් විශාල ප්‍රාග්ධනයක් සහිතව මහා පරිමාණ ව්‍යාපාර කටයුතු වල යෙදේ. එම සමාගම් ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට දායක වන්නේ කෙසේද? (ලකුණු 04)

The National e-Learning Portal for The General Education

(05) I. ලොතරැයි ජයග්‍රහණයක් ලද පුබුදු රු.150000.00 ක් වටිනා ලැප්ටොප් පරිගණකයක් මිලදී ගත් අතර ඉතිරි මුදලින් කොටසක් ස්ථාවර ගිණුමක ආයෝජනය කරන ලදී. ඔහුගේ සොහොයුරා මාසයකින් ගෙවීමේ පොරොන්දුව පිට තවත් රු.50000.00 ක් ණයට ඉල්ලා ගන්නා ලදී. එම සිද්ධියට අනුව මුදල් භාවිත කර සිදු කොට ඇති මුදලේ කාර්යයන් හඳුන්වන්න. (ලකුණු 04)

II. ශ්‍රී ලංකාවේ භාවිත ව්‍යවහාර මුදල් ඇසුරින් හොඳ මුදලක ලක්ෂණ 4 ක් පැහැදිලි කරන්න. (ලකුණු 04)

III. (අ) වර්තමානයේ ජනප්‍රිය ගෙවීම් මාධ්‍යයක් ලෙස ණයපත් භාවිතා කෙරේ. ඊට බලපා ඇති හේතු මොනවාද? (ලකුණු 02)

(ආ) බැංකු මුදල් හා විද්‍යුත් මුදල් අතර වෙනස සංසන්දනය කරන්න. (ලකුණු 02)

IV. (අ) රුපියල අවප්‍රමාණය වීමේ ප්‍රතිවිපාක මොනවාද? (ලකුණු 02)

(ආ) තත්කාලීන දළ පියවීම් ක්‍රමය නිසා මහජනතාවට අත්වන වාසි 2 ක් දක්වන්න. (ලකුණු 02)

V. වාණිජ බැංකු පවත්වාගෙන යන තැන්පතු වර්ග කීපයක් තිබේ. ඉන් ව්‍යාපාරික කටයුතු පහසුවෙන් කරගෙන යාමට වඩාත් සුදුසු ගිණුම් වර්ගය නම් කර එමගින් ව්‍යාපාරිකයින්ට ලබා ගත හැකි පහසුකම් මොනවාදැයි දක්වන්න. (ලකුණු 04)

The National e-learning Portal for The General Education

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## දෙවන වාර පරීක්ෂණය - 2019 මාර්තු

**12 ශ්‍රේණිය** | **ව්‍යාපාර අධ්‍යයනය** | **විසඳුම් පත්‍රය**

## I - පත්‍රය

01. - 4 02. - 1 03. - 3 04. - 5 05. - 1 06. - 3 07. - 1 08. - 4 09. - 5 10. - 2

(11) අ) 1. වෙළඳාම 2. උපකාරක සේවා 3 හා 4 සඳහා පහත ඒවායෙන් ඕනෑම 2කට ලකුණු ලබා දෙන්න.
බැංකු රක්ෂණය, ප්‍රවාහනය, සන්නිවේදනය, ගබඩාකරණය

ආ) 1. පරිපාලන 2. මානව සම්පත් කටයුතු 3. නිෂ්පාදන 4. පර්යේෂණ හා සංවර්ධන

(12) අ) දූරිය හැකි බව, සමානාත්මතාවය

ආ) සාධාරණ ආදායම් ව්‍යාප්තිය, ආර්ථික ස්ථායිතාවය

(13) අ) ඒකාබද්ධ වීම, අත්පත්කර ගැනීම

ආ) 1. ආදායම් මට්ටම ඉහළයාම 2. ක්‍රය ශක්තිය ඉහළ යාම 3. භාණ්ඩ ඉල්ලුම වැඩිවීම
4. නිෂ්පාදනය වැඩිවීම

(14) 1. සත්‍යයයි. 2. අසත්‍යයයි 3. අසත්‍යයයි 4. සත්‍යයයි

(15) අ) ලංකා ක්ලියර් (පෞද්) සමාගම T + 1 (ගණුදෙනුව සිදුවූ දිනය, තවත් එක් දිනයක්)

ආ) 1. ජංගම ගිණුම, ඉතිරිකිරීමේ ගිණුම්, ස්ථාවර තැන්පතු
2. ණය, අයිරා පහසුකම් (පාරිභෝගික ණය හා ව්‍යාපාරික ණය වෙන වෙනම ලියා තිබුණට ලකුණ නැත.
එක් හිස්තැනක ණය වෙනුවට මේ දෙකම එකම හිස්තැනේ ලියා ඇත්නම් පමණක් ලකුණු ලබාදෙන්න.)

(16)

| පරිසර බලවේග | හිතකර බලපෑම් | අහිතකර බලපෑම් |
|---|---|---|
| 1. කළමණාකරුවන් | ගන්නා තිරණ නිවරුදි වීම | තීරණ ගැනීමට පසුබට වීම |
| 2. සම්පත් | සම්පත් බහුල වීම | සම්පත් හිඟවීම |
| 3. සැපයුම්කරුවන් | කළට වේලාවට ගුණාත්මක අමුද්‍රව්‍ය සැපයීම | කළට වේලාවට ගුණාත්මක අමුද්‍රව්‍ය නොසැපයීම |
| 4. තරඟකරුවන් | තරඟකරුවන් , වෙළෙඳපොළනේ ඉවත්වීම | තරඟකරුවන් නිෂ්පාදනවල මිල අඩුවීම |

(17)
* සේවා නියුක්තියට දායකවීම
* බදු ගෙවීම නොපිරිහෙලා ඉටුකිරීම
* අපද්‍රව්‍ය කළමාණාකරණය
* ප්‍රජා සත්කාරක සේවා
* හරිත නිෂ්පාදන
* පරිසර හිතකාමී ලෙස කටයුතු කිරීම.

(18) 1. පරිසර කළමාණාකරණ පද්ධති සහතිකකරණය
2. සමාජ වගකීම්කරණය සඳහා හඳුන්වාදුන් මාර්ගෝපදේශය
3. වෘත්තීය සෞඛ්‍යය හා සුරක්ෂිතතා කළමණාකරණ පද්ධති සහතිකකරණය
4. බල ශක්ති කළමණාකරණ සහතිකකරණය

(19) 1. පවුම් - Pound
2. යුරෝ - Euro
3. රෙන්මින්බි හෝ යුආන් - (Chinese Renminibi / RMB & Chinese Yuan)
4. වොන් - Won

(20) 1. මධ්‍යම පරිසර අධිකාරිය
2. මොබයිල් ඩේටා
3. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
4. වයිෆයි - Wifi

# II - පත්‍රය

(01) I (අ) මිනිසාගේ ජීවන රටාව සංකීර්ණ වීම
මිනිස් සිතුම් පැතුම් වෙනස්වීම
ගෝලීයකරණයේ බලපෑම
තාක්ෂණයේ දියුණුව
ප්‍රචාරණයේ බලපෑම (කරුණු 4 ට ලකුණු 02)

(ආ) එළවළු අලෙවි කිරීම / කුසුම්සිරි තුළ පවතින අවදානම (ලකුණු 02)

II (අ) භාණ්ඩ හුවමාරුව, මුදල් භාවිතය, කාර්මික විප්ලවය, තොරතුරු ආර්ථිකය
(නිවැරදි අනුපිළිවෙලට ලකුණු 02)

(ආ) ගෝලීයකරණය ව්‍යාප්ත වීම
විද්‍යුත් ව්‍යාපාර බිහිවීම
විද්‍යුත් මුදල් භාවිතයට පැමිණීම
පරිසරය පිළිබඳ සැලකිලිමත් විම
ව්‍යාපාර සමාජ වගකීම් පිළිබිද සැලකිලිමත්වීම (කරුණු 4 ට ලකුණු 02)

III. දුව කැපිම - නිෂ්පාදනයේ ස්වභාවය අනුව
දෙසැම්බර් මස සේල් පැවැත්වීම - අරමුණ අනුව
රාජ්‍ය දුව සංස්ථාව - හිමිකාරිත්වය අනුව
විශාල සේවක සංඛ්‍යාවක් සිටීම - පරිමාණය අනුව
නිෂ්පාදිත ගෘහ භාණ්ඩ - නිෂ්පාදන අංශය අනුව
(කරුණු 5 ක් නිවැරදිව දැක්වීමට 04) (කරුණු 4 ක් නිවැරදිව දැක්වීමට 03)
(කරුණු 3 ක් නිවැරදිව දැක්වීමට 02) (කරුණු 2 ක් නිවැරදිව දැක්වීමට 01)

IV. ව්‍යාපාර කාර්යය - උදාහරණ
නිෂ්පාදනය - රෙදි සපයා ගැනීම, තත්ත්ව පාලනය
අලෙවිකරණය - ඇඟලුම් මිල නියම කිරීම, ප්‍රවර්ධන කටයුතු
පරිපාලනය - සේවක ලිපිගොනු පවත්වාගෙන යාම
මූල්‍ය කටයුතු - වැටුප් ගෙවීම, මැෂින් මිලදී ගැනීම
මානව සම්පත් කටයුතු - සේවකයින් බඳවා ගැනීම, සේවක උසස් කිරීම
පර්යේෂණ හා සංවර්ධන කටයුතු - ඇඟලුම්වල ගුණාත්මක බව වැඩි කිරීම
(ව්‍යාපාර කාර්යයන් 6 ක් නම් කිරීමට 02)
(උදාහරණ නම් කිරීමට 02)

V. පාර්ශවය - ව්‍යාපාරයකට වැදගත් වීමට හේතු
අයිතිකරුවෝ - ආයෝජනය වැඩි කිරීමට
ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු කිරීමට
සේවකයෝ - සේවක කාර්යක්ෂමතාවය වැඩි කර ගැනීමට
සේවකයින් රඳවා ගැනීමට
සේවක ආකර්ශනය ලබා ගැනීමට
ණය හිමියෝ - අඛණ්ඩව අරමුදල් සම්පාදනය කර ගැනීමට
අඩු පිරිවැයකින් අරමුදල් සම්පාදනය කර ගැනීමට
රජය - බදු සහන ලබා ගැනීමට
යටිතල පහසුකම් ලබා ගැනීමට
තාක්ෂණික දැනුම ලබා ගැනීමට
ගණුදෙනුකරුවෝ- අදාල භාණ්ඩ හෝ සේවා සඳහා වෙළඳපොල සුරක්ෂිත කර ගැනීමට
පාරිභෝගික විශ්වාසය ගොඩනගා ගැනීමට
ගණුදෙනුකරුවන්ගේ පක්ෂපාතීත්වය ඇති කර ගැනීමට
(පාර්ශව 4 ක් දැක්වීමට ලකුණු 02) (හේතු දැක්වීමට 02)

(02) I. (අ) මධ්‍යම රජය, පළාත් සභා, පළාත් පාලන ආයතන
(කරුණු 3 ම නිවැරදි නම් ලකුණු 01)

(ආ) රජය - යටිතල පහසුකම් සැපයීම
බදු අය කිරීම
පළාත් සභා - ව්‍යාපාර නාම ප්‍රඥාප්තිය ක්‍රියාත්මක කිරීම
ආරක්ෂක සේවා ලබා ගැනීම
පළාත් ආදායම් දෙපාර්තමේන්තුව මගින් බදු අය කර ගැනීම.
පළාත් පාලන ආයතන - අපද්‍රව්‍ය ඉවත් කිරීම
ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම
වරිපනම් බදු අය කිරීම
(එක් ආයතනයකට උදාහරණ 2 බැගින් ලකුණු 03)

II. (අ) * දේශීය සම්පත් නිෂ්පාදන ක්‍රියාවලියට යොදා ගැනීම.
* රජයට බදු ගෙවීම
* රැකියා ඉඩ ප්‍රස්ථා ඇති කිරීම
* නවෝත්පාදන බිහි කිරීම
* පරිසරය සුරැකීමට කටයුතු කිරීම
* විදේශ විනිමය ඉපැයීම
* ප්‍රාදේශීය සංවර්ධනයට දායක වීම
* ආර්ථික වර්ධනයට දායක වීම (කරුණු 4 කට ලකුණු 02)

(ආ) * තාප විදුලිබලාගාර ඉදි කිරීම
* කුඩා හා මධ්‍ය පරිමාණ ජල විදුලි බලාගාර ඉදි කිරීම
* විකල්ප බලශක්ති ප්‍රභවයන් කෙරෙහි යොමුවීම්
* බලශක්ති නාස්තිය අවම කිරීම
* විදුලිය බෙදා හැරීමේදී සිදු වන නාස්තිය අවම කිරීම
* වෙනත් අදාළ කරුණු (කරුණු 4 කට ලකුණු 02)

III. (අ) * නීතිරීති ලිහිල් කිරීම
* විනිමය ලිහිල් කිරීමේ පනත් සම්මත කිරීම
* යටිතල පහසුකම් සංවර්ධනය
* නිදහස් වෙළඳ කලාප ඇති කිරීම
* බදු සහන හා බදු විරාම ලබා දීම
* වෙළඳ හා ආයෝජන ගිවිසුම් වලට එළඹීම (කරුණු 4 කට ලකුණු 02)

(ආ) * අයහපත් කාලගුණය
* එලදාව අඩුවීම
* ආදේශන බිහිවීම
* ආයෝජකයින් කර්මාන්තයෙන් ඉවත්වීම
* පිරිවැය වැඩිවීම
* විදේශ ඉල්ලුම අඩුවීම (කරුණු 4 කට ලකුණු 02)

IV. (අ) * ලාභ අපේක්ෂාව නිසා කරනු ලබන පාරිභෝගික විෂමාචාර
* සුබසාදන කටයුතු නොසලකා හැරීම
* වෙළඳපොල ඒකාධිකාරී තත්ත්වයක් ඇතිවීම මගින් භාණ්ඩ හා සේවා මිල ඉහළ යාම
* පරිසර දූෂණය ඉහළ යාම (කරුණු 4 කට ලකුණු 02)

(ආ) මැලේසියාව, හොංකොං, චීනය, එක්සත් රාජධානිය, ඉන්දියාව, නෙදර්ලන්තය, මුරුසි රාජ්‍යය, සිංගප්පූරුව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ඇමරිකා එක්සත් ජනපදය (රටවල් 6 කට ලකුණු 02)

V. * නෛතික පරිසරය - නීති කඩ කරන්නන්ට දඬුවම් පැමිණවීම
* දේශපාලන පරිසරය - පවතින රජයේ තීරණයක් වීම
* ප්‍රජා පරිසරය - ජනතාවට නැවුම එළවළු පළතුරු ලබා ගත හැකි වීම
* ස්වාභාවික පරිසරය - පරිසරය ආරක්ෂා වීම
* තාක්ෂණික පරිසරය - දිරාපත් වන පොලිතීන් නිෂ්පාදනය

(පරිසර බලවේග 4 ට ලකුණු 02)
(බලපෑම් 4 ක් දක්වීමට ලකුණු 02)

(3) I.

| ව්‍යාපාරිකයා | ව්‍යවසායකයා |
|---|---|
| * පවතින තත්ත්වයක් තුළ ව්‍යාපාරය අරඹයි | * නව අදහසක් මත ව්‍යාපාර අරඹයි |
| * අවදානම් මගහරිමින් ආරක්ෂාකාරීව කටයුතු කරයි | * අවදානම් භාරගනී |
| * කෙටිකාලීන ඉලක්ක ඇත | * දිගු කාලීන ඉලක්ක ඇත |
| * සම්ප්‍රදාය මත කටයුතු කරයි | * නිර්මාණශීලීයි |
| * තරගකාරී බවට කැමැති නැත | * තරගය අපේක්ෂාවෙන් කටයුතු කරයි |

(සන්සන්දනාත්මකව කරුණු 4 ක් දැක්වීමට ලකුණු 04)

II. **පුද්ගල ප්‍රතිලාභ**

* පුද්ගල හැකියාවලින් ප්‍රයෝජන ගැනීමට ඉඩ ප්‍රස්තාව ලැබීම
* ඉහළ කැපවීම මත ඉහළ ප්‍රතිලාභ ලැබීම
* සමාජ තත්ත්වය හා පිළිගැනීම ඇතිවීම
* ආත්ම තෘප්තිය ලැබීම
* පෞද්ගලික මූල්‍යමය ලාභ ලැබීම
* නිදහස් තීරණ ගත හැකි වීම

**සමාජයීය ප්‍රතිලාභ**

* නව රැකියා අවස්ථා උත්පාදනය වීම
* ආදායම් අවස්ථා බිහිවීම
* නව භාණ්ඩ හා සේවා පරිභෝජනයට අවස්ථාව ලැබීම
* ජනතාවගේ ජීවන මට්ටම ඉහල යාම
* ප්‍රාදේශීය සම්පත් නිෂ්පාදනයට යොදා ගැනීම
* නව වෙළඳපොලවල් සංවර්ධනය වීම
* ජාතික නිෂ්පාදනය ඉහළ යාම (පුද්ගල ප්‍රතිලාභ 4 ක් සඳහා ලකුණු 02)

(සමාජයීය ප්‍රතිලාභ 4 ක් සඳහා ලකුණු 02)

III. * ස්වයං ඇගයීම - කළහැකියි යන විශ්වාසය මත පිහිටීම
* පුහුණුව - විවිධ පුහුණු වැඩසටහන් වලට සහභාගී වීම
* අධ්‍යාපනය - අන්තර්ජාලය මගින් අවශ්‍ය තොරතුරු ලබා ගැනීම
* අත්දැකීම් වලින් ප්‍රයෝජන ගැනීම - කලින් මඳුරු දූල් නිෂ්පාදන ආයතනයක සේවය කර තිබීම

(කරුණු 4 උදාහරණ සහිතව දැක්වීමට ලකුණු 04)

IV. * තම ව්‍යාපාරයේ ප්‍රධානියා තමාම වීම
* කැපවීම මත සාර්ථක විය හැකි වීම
* පෞද්ගලික තෘප්තිය
* නිදහස් තීරණ ගත හැකි වීම
* නිර්මාණශීලිත්වය ප්‍රදර්ශනය කළ හැකි වීම
* සමාජ තත්ත්වය හා කීර්තිනාමය ලැබීම

(කරුණු 4 කට ලකුණු 04)

V. රන් අස්වැන්න, ගොවි නවෝදා, දිරි සවිය, මාධ්‍ය අරුණ, සූර්ය බල ශක්ති උත්පාදන ව්‍යාපෘතිය, රිය බලසවි, ජය ඉසුර, සොඳුරු පියස, රිය ශක්ති (යෝජනා ක්‍රම 4 ක් නම් කිරීමට ලකුණු 04)

(04) I. (අ) * මූල්‍ය පහසුකම් සැපයීමට
* දළ දේශීය නිෂ්පාදනයට ලබා දී ඇති දායකත්වය ගණනය කිරීමට
* විවිධ ආයතන විසින් සපයන පහසුකම් නිශ්චිත වශයෙන්ම අදාළ කුඩා හා මහා පරිමාණ ව්‍යාපාරවලට
* ලැබෙන බව සහතික කර ගැනීමට
* බදු විරාම, බදු සහන ලබා ගැනීමට
* ව්‍යාපාර සම්බන්ධයෙන් රජය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හා වෙනත් පහසුකම් ලබා දීමට
* සම්පත් බෙදා දීමේ විෂමතාව අවම කිරීමට රජයේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම

(කරුණු 4 කට ලකුණු 02)

(ආ) * තම හැකියා හා කුසලතා ඇගයීම
* පවතින වෙළඳපොලට ළඟා වීමේ හැකියාව
* අවශ්‍ය කාරක ප්‍රාග්ධනය
* ස්ථානගත කිරීම

* සේවක අවශ්‍යතා හා සේවක නීතිරීති හඳුනා ගැනීම
* යොදා ගන්නා නිෂ්පාදන ශිල්පීය ක්‍රමය
* යොදා ගන්නා ව්‍යාපාර සංවිධාන ක්‍රමය
* අවශ්‍ය අමුද්‍රව්‍ය පිළිබඳව (කරුණු 4 කට ලකුණු 02)

II. (අ) * ව්‍යාපාර නාමයක් පැවතීම
* අරමුණක් පැවතීම
* කිසියම් ආර්ථික කටයුත්තක නියැලීම
* පුද්ගලයින් සමූහයක් නිරතව සිටීම
* සංවිධාන ව්‍යුහයක් පැවතීම
* පැවැත්මක් තිබීම (කරුණු 4 කට ලකුණු 02)

(ආ) * ලියාපදිංචිය අනිවාර්ය නොවීම
* වගකීම අසීමිත වීම
* පෞද්ගලික හිමිකාරිත්වය
* නෛතික පුද්ගලභාවයක් නොමැතිවීම
* අඛණ්ඩ පැවැත්මක් නොමැතිවීම (කරුණු 4 කට ලකුණු 02)

III. A. හවුල් ව්‍යාපාර
B. සී/ස පෞද්ගලික සමාගම්
C. වරලත් ව්‍යාපාර
D. සමූපකාර (ලකුණු 02)

(ආ) ✓ ප්‍රවර්ධන වියදම් අඩු කර ගැනීමට ඇති හැකියාව
✓ සාමූහිකව කටයුතු කිරීමෙන් වඩා ශක්තිමත්ව නැගී සිටීමට ඇති හැකියාව
✓ මහා පරිමාණ ව්‍යාපාර වාසි ලබා ගැනීමේ හැකියාව
✓ වෙළඳපොල ඒකාධිකාරී තත්ත්වයක් ඇති කිරීම හා පාලනය කිරීමට ඇති හැකියාව වර්ධනය කිරීම
✓ තනිව කටයුතු කිරීමේදී සිදු වන අලාභ හා අපතයන් අවම කර ගැනීමට ඇති හැකියාව (ලකුණු 02)

IV. රාජ්‍ය සංස්ථාවක් සම්බන්ධයෙන් සත්‍ය කරුණු
* පොදු හෝ විශේෂ පනතක් මගින් සම්මත කිරීම
* රාජ්‍ය සංස්ථා වලට නෛතික පුද්ගලභාවයක් ඇත.
* ක්ෂේත්‍ර 4 තුළම කටයුතු කරයි
* අයිතියෙන් කොටසක් පෞද්ගලික අංශයට පැවරිය හැක

රජයේ දෙපාර්තමේන්තුවක් සම්බන්ධයෙන් අසත්‍ය කරුණු 4
* ප්‍රාග්ධනයට පෞද්ගලික අංශය දායකවීම
* නෛතික පුද්ගලභාවයක් නැත.
* සේවා අංශයේ පමණක් කටයුතු කරයි
* පාලනයට ආයතන සංග්‍රහයේ බලපෑමක් නොමැති වීම (සත්‍ය කරුණු 4 කට ලකුණු 02)
(අසත්‍ය කරුණු 4 කට ලකුණු 02)

V. * දළ ජාතික නිෂ්පාදනයට වැඩි දායකත්වයක් ලබා දීම
* රැකියා අවස්ථා වැඩියෙන් බිහිවීම
* නවීන තාක්ෂණය යොදා ගැනීම
* තරගකාරිත්වයට මුහුණදීමේ ශක්තිය වැඩිවීම
* නවෝත්පාදන සඳහා අවස්ථාව ලැබීම
* විදේශ වෙළඳපොලට පිවිසීම පහසුවීම
* කොටස් වෙළඳපොල සංවර්ධනය වීම හා ආර්ථිකය තුල ඉතිරි කිරීම් වර්ධනය වීම (කරුණු 4 කට ලකුණු 04)

(05) I. * විනිමය මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම-රු.150000.00 ක් වටිනා ලැප්ටොප් පරිගණකයක් මිලදී ගැනීම
* වටිනාකම මැනීමේ මිණුම් දණ්ඩක් ලෙස කටයුතු කිරීම- පරිගණකයේ වටිනාකම රු.150000.00 ක් වීම.
* වටිනාකමේ සන්නිධියක් ලෙස කටයුතු කිරීම- ස්ථාවර ගිණුමක් ආරම්භ කිරීම.
* විලම්භිත ගෙවීම් මාධ්‍යයක් වීම - මසකින් ගෙවීමේ පොරොන්දුව මත ණය මුදලක් ලබා ගැනීම.
(කාර්යයන් 4 නම් කිරීමට ලකුණු 02) (උදාහරණ 4 නම් කිරීමට ලකුණු 02)

II. පොදු පිළිගැනීම - මහජනතාව ව්‍යවහාර මුදල් ලෙස භාවිතා කිරීම
ගෙනයාමේ පහසුව - කාසි හෝ නෝට්ටු පහසුවෙන් එහා මෙහා ගෙන යා හැකි විම
කුඩා ඒකක වලට බෙදිය හැකි බව - ඕනෑම වටිනාකමක් ගෙවීමේ හැකියාව
අනුකරණය අපහසු විම- ව්‍යාජ ලෙස සකස් කිරීම අපහසු වීම
කල්පැවැත්ම - විශේෂිත කඩදාසියක මුද්‍රණය කිරිම හා කාසි දිගු කාලයක් පැවැතීම
සමජාතීය බව - පහසුවෙන් වෙන් කර හඳුනා ගත හැකි බව (ලක්ෂණ 6 ක් නම් කිරීමට ලකුණු 02)
(උදාහරණ 6 ක් දැක්වීමට ලකුණු 02)

III. (අ) * ණයට භාණ්ඩ ලබා ගත හැකිවීම හා කිසියම් සීමාවක් දක්වා මුදල් ණයට ගත හැකිවීම
* ජාත්‍යාන්තර ගණුදෙනුවලදී භාවිතා කළ හැකි වීම
* ආරක්ෂාකාරී වීම
* විවිධ වට්ටම් සහන ලබා ගත හැකි වීම
* පොලී රහිතව වාරික ක්‍රමයට කෙටිකාලීනව භාණ්ඩ ලබා ගත හැකි වීම
* ණයපත් වලින් ගණුදෙනු කිරිමේදී ප්‍රසාද ලකුණු හිමිකර ගත හැකිවීම (කරුණු 4කට ලකුණු 02)

(ආ)

| <u>බැංකු මුදල්</u> | <u>විද්‍යුත් මුදල්</u> |
|---|---|
| * ජංගම ගිණුමේ ශේෂයක් වේ. | * විද්‍යුත් මාර්ගයෙන් ගණුදෙනු සිදුවේ |
| * චෙක්පත් මගින් ගනුදෙනු සිදුවේ. | * විවිධ කාඩ්පත් මගින් ගණුදෙනු සිදුවේ |
| * දේශීයව පමණක් ගණුදෙනු සිදුවේ. | * ජාත්‍යන්තරව ගණුදෙනු කල හැක. |

(කරුණු 2 කට ලකුණු 02)

IV. (අ) * ආනයන ප්‍රමාණය අඩුවීම
* නිෂ්පාදන පිරිවැය ඉහළ යාම
* රටේ උද්ධමනකාරී තත්ත්වයක් ඇතිවීම
* විදේශ භාණ්ඩ පරිභෝජනය අඩුවීම
* අපනයන ප්‍රමාණය වැඩිවීම (කරුණු 4 කට ලකුණු 02)

(ආ) * චෙක්පත් භාවිතය අඩුවීම
* කලට වේලාවට ප්‍රතිපාර්ශවයන්ගෙන් ලැබිය යුතු මුදල් ලබා ගැනීම
* ඉතා හදිසි ගෙවීම් කාලපමාවකින් තොරව සිදු කළ හැකිවීම (කරුණු 4 කට ලකුණු 02)

V. * ජංගම ගිණුම (ලකුණු 01)
* චෙක්පත් මගින් ගෙවීම් කල හැකි වීම
* ප්‍රේෂණ පහසුකම් ලබා ගත හැකි වීම
* නිත්‍ය නියෝග මත ගෙවීම් කල හැකි වීම
* අයිරා පහසුකම් ලබා ගත හැකිවීම
* බැංකු ගිණුම් ප්‍රකාශයක් ලබා ගත හැකි වීම
(පහසුකම් වර්ග 03 ක් දැක්වීම සඳහා)